සැබැවින්ම මිනිසකු නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙතින් අවසර පැතුවේය. එවිට ඔබලා ඔහුට අවසර දෙනු ගෝත්රයේ සහෝදරයා නපුරෙකි. යැයි පැවසූහ.

ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය විසින් වාර්තා කරන ලදී. “සැබැවින්ම මිනිසකු නබි - සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙතින් අවසර පැතුවේය. එවිට එතුමා: “ඔබලා ඔහුට අවසර දෙනු ගෝත්රයේ සහෝදරයා නපුරෙකි. යැයි පැවසූහ.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [බුහාරි හා මුස්ලිම් හි වාර්තා වී ඇත]

මිනිසකු නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වෙත අවසර පැතුවේය. එවිට ඔබලා ඔහුට අවසර දෙනු එම ගෝත්රයේ සහෝදරයා -එම ගෝත්රයේ කොළුවා- නපුරෙකි. යැයි පැවසූහ. ඔහු වාඩි වූ කල්හි නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා ඔහුගේ මුහුණෙහි සතුට පෙන්වූහ. ඔහු වෙත අත දිගු කළහ. එම පුද්ගලයා ගිය කල්හි ආඉෂා -රළියල්ලාහු අන්හා- තුමිය එතුමාට අහෝ අල්ලාහ්ගේ දූතයාණනි, ඔබ එම මිනිසා දුටු කල්හි ඔහු ගැන මෙසේය මෙසේය යැයි පැවසුවෙහිය. පසුව ඔහුගේ මුහුණට ඔබේ සතුට පෙන්වා, ඔහු වෙත දෑත් දිගු කළෙහිය.? එවිට අල්ලාහ්ගේ දූතයාණන් -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා “අහෝ ආඉෂා, නපුරා ගැන ඔබ මට ප්රතිඥා දුන්නේ කවදාද. මළවුන් කෙරෙන් නැගිටුවනු ලබන දිනයේ අල්ලාහ් අබියස නිලයෙන් වඩාත් නපුරුතම මිනිසා වනුයේ ඔහුගේ පීඩාව හේතුවෙන් මිනිසුන් ඔහුව අතහැර දැමූ පුද්ගලයාය. එහෙයින් මේ මිනිසා කලහකාරී හා පීඩාකාරී ජනයා අතුරිනි. එහෙයින් සල්ලල්ලාහු අලය්හි වසල්ලම් තුමා ඔහුට උරුම වූ ඔහුගේ අඩුපාඩුව ගැන මතක් කරමින් ඔහුගේ ගෝත්රයේ කොළුවා නපුරෙකි යැයි පැවසූහ. එය ඔහුගේ අර්බුධකාරී තත්ත්වයෙන් ජනයා වළක්වා ඔවුන් ඔහු තුළින් නොමඟ නොයා යුතු බැවිනි. එහෙයින් ඔබ නපුරු මිනිසෙකු දුටු වේ නම් මිනිසුන් ඔහුගේ කතාවිලාශයෙන් මන්මත් වී සිටින්නේ නම් එවිට එම පුද්ගලයා නපුරෙක් බව පැහැදිලි කර සිටීම ඔබ වෙත පැවරෙන්නේය. හේතුව ඔහු හේතුවෙන් ජනයා සීමාව ඉක්මවා කටයුතු නොකළ යුතු බැවිනි. චතුර ලෙසින් කතා කළ හැකි මිනිසුන් කොපමණක් දෙනෙක් සිටිත් ද ඔහුගේ ශරීරය ඔබ දුටු විට ඔබව මවිතයට පත් කරයි. ඔහු යමක් පවසයි නම් ඔබ ඔහුගේ ප්රකාශයට සවන් දෙයි. නමුත් ඔහු තුළ කිසිදු යහපතක් නැත. ඔහුගේ තත්ත්වය වටහා දීම අනිවාර්යය වේ. එතුමා එම මිනිසා සමඟ මෘදු ලෙස කටයුතු කර ඇති බව සඳහන් වේ. එය පරිපාලනයේ එක් අංගයකි. විද්වත්හු පරිපාලනයෙදී එය අපේක්ෂා කරනු ලබන්නක් බව පිළිගනිති. එනම් සෙසු අය සමඟ ගනු දෙනු කිරීමේදීය. එය ඔහු ගැන කයිවාරු දෙඩීමට විරුද්ධය. එසේ කයිවාරු දෙඩීම ඔහු සතු වගකීමෙන් ඔහුව පහළට ඇද දමයි. වැරදි කිරීමේ සීමාව ඉක්මවා යයි. වැරදි කිරීමට පොළඹවයි. එවන් තත්ත්වයක් සුදු නොවන්නකි. හේතුව එය සූරා අල් කලම් හි 9 වන වැකියේ අල්ලාහ් මෙසේ පවසා සිටියි. “ඔබ ලිහිල් කළෙහි නම් ඔවුන්ද ලිහිල් කරන්නට කැමති වෙති.“ යහපත තහවුරු කරන අයුරින් සිදු කරන පරිපාලනයත් මිනිසුම් සමග ගණු දෙනු කිරීමත් ඒ මත රැඳී නොසිටීමත් අවම අර්බුධකාරී තත්ත්වයන් උදා කරයි. සැබැවින් එය දහම්ගත කරුණකි.

http://www.sunnah.global/hadeeth/si/show/3688